## 200 – කුසගිනි වෙමි

කුසගිනි වෙමි මා සමිඳේ
දිව බොදුනින් සතපනු මැන
පිපාස වෙමි මා සමිඳේ
දිව රුහිරෙන් පොවනු මැනවි

මහ කතරේ සාගින්නේ
ඔබේ පුතුන් මොර දෙන සඳ
එ හඬ අසා අහස පලා
මන්නා දුන් දෙවි සමිඳේ

ජීවය දෙන බොඳුන මමයි
ඔබ කීවා මට මතකයි
කුස ගිනි මා නිවනු මැනවි
ඔබගේ ජීවන බොඳුනින්

ජීවන ජල උල්පත මම
ඔබ කී සැටි මට මතකයි
පිපස මගේ නිවනු මැනවි
ජීවන උල්පත් ජලයෙන්